**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

----------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

----------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---------------------

ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූනි 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම් , සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුකරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණ වලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම.<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු.<br>3. කාර්යභාරයන් ඉටු නොකිරීම.<br>4. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා නොවීම. | 2.10 (i)<br>2.4<br>2.3.1 (අ)<br>2.3.1(ආ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම්. | 2.13 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු. | 2.5 |

| | | | |
|---|---|---|---|
| | විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | | |
| 128(1)(ඍ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීම.<br>2. පෞද්ගලික ආයතනයකින් ලැබිය යුතු ගාස්තු | 2.11<br>2.8 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු. | 2.16 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ /සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවල දී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවට ද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව. | 1. පාඩු හා හානි<br>2. මතභේදයට තුඩුදෙන ගනුදෙනු<br>3. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.6<br>2.9<br>2.16 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

-------------------------------------------------

(අ) කොට්ඨාස හා ගම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ කටයුතු සමායෝජනය කිරීම මෙන්ම නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමටත්, අදාළ ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයන් වශයෙන් කටයුතු කරමින් කරනු ලබන ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

(ඇ) විමධ්‍යගත අයවැය වැඩසටහන හා වෙනත් සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ගෙවීම්.

(ඇ) පළාත් සභාවට පැවරී ඇති කාර්යයන් සඳහා අවශ්‍ය විට සහභාගී වීම සහ එහිදී කළ යුතු වන ආදායම් රැස්කිරීම සහ ගෙවීම් කටයුතු.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරයන් පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල: -<br>හම්බන්තොට<br>අම්බලන්තොට<br>තිස්සමහාරාම<br>ලුණුගම්වෙහෙර<br>සූරියවැව<br>තංගල්ල<br>බෙලිඅත්ත<br>වීරකැටිය<br>ඕකෙවෙල<br>වලස්මුල්ල<br>කටුවන<br>අඟුණුකොලපැලැස්ස | 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත | මධ්‍යම රජයෙන් සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. |

## 2.3 කාර්යසාධනය

### 2.3.1 කාර්යභාර්යයන් ඉටු නොකිරීම

(අ) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ රේඛීය අමාත්‍යාංශ 3 ක් මඟින් සංවර්ධන ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් වෙත සලසා දී තිබූ රු.28,161,812 ක ප්‍රතිපාදනවලට අදාල ව්‍යාපෘති නියමිත කාලය තුළදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හෝ වෙනත් විවිධ හේතු මත එම ප්‍රතිපාදන ආපසු පවරාගෙන තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් “තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණු නමුත්, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ඒ

සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හා අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීමට ද සමාලෝචිත වර්ෂයේ දී පියවර ගෙන නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, සීමිත ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කළ හැකි වන්නේ මිලදී ගැනීම සඳහා මූලාශ්‍ර කිහිපයක් පමණක් තිබෙන අවස්ථාවල දී පමණි. එසේ වුව ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 අවසන් කාර්තුව තුළ පරිගණක, පරිගණක උපාංග හා ටැබ් යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 16.93 ක මුදලක් වියදම් කර තිබුණ ද ඒ සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් සිදු නොකොට අම්බලන්තොට, මාතර සහ කොළඹ ප්‍රදේශයේ තෝරාගත් ආයතන 12 කින් සීමිත ලංසු කැඳවීම් සිදු කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් අනාවරණය විය.

### (අ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු වාහන 15 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| කාර්යාලය | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ත්‍රීරෝද රථය | 01 | අවුරුදු 06 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තංගල්ල | යතුරුපැදි | 02 | අවුරුදු 03 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලුණුගම්වෙහෙර | යතුරුපැදිය | 01 | අවුරුදු 03 |

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ගොඩනැඟිල්ලක් සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු තවත් ගොඩනැඟිල්ලක් විවිධ රජයේ ආයතන 5 ක් වෙත අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.

(ඇ) **විධිමත්ව පවරා නොගත් වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2013 සහ 2014 වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් රු. 41,538,234 ක් වියදම් කර හෙක්ටයාර් 1.0366 ක භූමි භාගයක් තුළ ඉදි කළ නව දිස්ත්‍රික් ලේකම් නිල නිවාසය, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 පාඩු හා හානි

1987 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු රු. 25,000 ට වැඩි වටිනාකමින් යුත් සිදුවීම් 23 කට අදාළ එකතුව රු. 10,305,337 ක් වූ හානි හා පාඩු සම්බන්ධ ලිපි ගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පසු විපරම් කටයුතු නිම නොවූ ඡේදවල යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2007<br>2008 | 6:5<br>12:2 | සූරියවැව හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් 110 දෙනෙකු සඳහා රියදුරු පුහුණු පාසල් වෙත මුදල් ගෙවා තිබුණ ද නියමිත පුහුණුව ලබා දී නොතිබුණි. |
| 2012.10.25 දිනැති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග | නියෝග අංක 16 | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් භූමියේ ඉදිකරන ලද නිල නිවාස 22 ක් දිස්ත්‍රික් ලේකම් වෙත පවරා දී නොතිබුණි. |
| 2012 | 1.5(අ) iii | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිරිමැටිය උස්සාන ජල යෝජනා ක්‍රමය සඳහා යොදා තිබූ PVC නලවලට වැඩිපුර ගෙවීම් කිරීම. |

## 2.8 කළමනාකරණ දුර්වලතා

සන්නිවේදන පහසුකම් සපයන පෞද්ගලික ආයතන 03 ක් විසින් හම්බන්තොට පරිපාලන සංකීර්ණයේ ස්ථාපිත කර ඇති සන්නිවේදන කුළුණු වෙනුවෙන් එම කුළුණු ස්ථාපිත කරන ලද 2012 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අය නොවූ බිම් කුලී වටිනාකම රු. 1,065,375 ක් ද, විදුලිය වියදම් සඳහා හිඟ වටිනාකම රු.727,215 ක් ද, වශයෙන් එකතුව රු.1,792,590 ක් අය විය යුතුව තිබුණි.

## 2.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

හම්බන්තොට පරිපාලන සංකීර්ණ භූමියේ ස්ථාපිත කර ඇති විදුලි උත්පාදක යන්ත්‍ර දෙක සඳහා ඉන්ධන යෙදීම වෙනුවෙන් නඩත්තු කර තිබූ දෛනික ධාවන සටහන් ලේඛනය අනුව 2016 අප්‍රේල් 27 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ඉන්ධන ලීටර් 11300 ක් මිලදී ගෙන තිබුණ ද විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා යොදා තිබූ ප්‍රමාණය ඉන්ධන ලීටර් 9900 ක් විය. ඒ අනුව රු. 133,000 ක් වූ ඉන්ධන ලීටර 1400 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

**2.10.1** 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳව තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 650.87 | 650.56 | 0.31 | 0.04 |
| | මූලධන | 128.11 | 125.56 | 2.55 | 1.99 |
| | **එකතුව** | **778.98** | **776.12** | **2.86** | **0.37** |
| 2014 | පුනරාවර්තන | 609.04 | 607.57 | 1.47 | 0.24 |
| | මූලධන | 395.70 | 395.49 | 0.21 | 0.05 |
| | **එකතුව** | **1,004.74** | **1,003.06** | **1.68** | **0.17** |
| 2015 | පුනරාවර්තන | 695.65 | 690.02 | 5.63 | 0.81 |
| | මූලධන | 228.10 | 167.34 | 60.76 | 26.64 |
| | **එකතුව** | **923.75** | **857.36** | **66.39** | **7.19** |
| 2016 | පුනරාවර්තන | 754.00 | 714.40 | 39.60 | 5.25 |
| | මූලධන | 113.00 | 108.60 | 4.40 | 3.89 |
| | **එකතුව** | **867.00** | **823.00** | **44.00** | **5.07** |
| 2017 | පුනරාවර්තන | 753.74 | 727.48 | 26.26 | 3.48 |
| | මූලධන | 490.80 | 301.51 | 189.29 | 38.56 |
| | **එකතුව** | **1,244.54** | **1,028.99** | **215.55** | **17.31** |

සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 9 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු.4,065,234 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනය සියයට 15 සිට සියයට 68 ක් දක්වා පරාසයක පැවතුණි.

(ආ) **පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අරමුණට පටහැනි කාර්යයන්ට යෙදවීම**

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයය අංක 263-1-1-2509 යටතේ ගංවතුර හා නායයෑම් හේතුවෙන් හානියට පත්වූ ප්‍රදේශවල පුනරුත්ථාපනය හා නැවත ඉදිකිරීමේ කටයුතු සඳහා ලබා දී තිබුණු රු. 350,000,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.1,834,901 ක් වියදම් කර හම්බන්තොට දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයට අනුමැතියකින් තොරව පරිගණක හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ඇ) **ඇස්තමේන්තුගත නොකළ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම**

වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඇස්තමේන්තුගත කර නොතිබූ ටැබ් යන්ත්‍ර 30 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 3,093,000 ක මුදලක් වියදම් කර තිබුණු අතර, පරිගණක 35 ක් මිලදී ගැනීමට ඇස්තමේන්තු කර සමාලෝචිත වර්ෂය තුළ දී ලැප්ටොප් හා ඩෙස්ක්ටොප් වශයෙන් පරිගණක 85 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 9,648,700 ක් දරා තිබුණි.

(ඈ) **පරිපූරක ඇස්තමේන්තු යටතේ අක්මුදල් ප්‍රමාණවත් නොවීම**

ගංවතුර හා නායයාම් නිසා දිස්ත්‍රික්කයේ විනාශ වූ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. මිලියන 350 ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් සලසා තිබුණ ද අක්මුදල් ප්‍රමාණවත්ව නොලැබීම නිසා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 181.4 ක කාර්යභාරයන් ඉටු කර නොතිබුණි. එම නිසා සලසා තිබුණු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 51 ක් ඉතිරි වී තිබුණි.

**2.10.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 22 ක් විසින් එකතුව රු. 3,175,370,042 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු. 2,410,747,449 ක් හා රු. 238,386,824 ක් වශයෙන් එකතුව රු. 2,649,134,273 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු. 487,688,346 ක් හා රු. 38,547,423 ක් වශයෙන් එකතුව රු. 526,235,769 ක් හෙවත්, ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 16 ක හා සියයට 13 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්දගස්මංකඩ කුඩා ගම්මාන 2 දකුණ ඉවුරු ප්‍රධාන ඇළ කණ්ඩියේ සිට දකුණු දෙසට පළමු මාර්ගයේ 2 වන හරස් මාර්ගය කැටගල් ඇල්ලීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.1,250,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.1,137,393 ක මුදලක් 2018 පෙබරවාරි 16 දින ගෙවා තිබුණි. එසේ

වුව ද භෞතික පරීක්ෂණ අවස්ථාව වූ 2018 අප්‍රේල් 24 දින වන විට මාර්ගයේ අතුරා තිබුණු කුට්ටිගල් මතුපිට ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් වැවක් සමඟ ගමක් සංවර්ධන වැඩසටහන - 2017 යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් රු. 31,315,221 ක ප්‍රතිපාදන, අවස්ථා 04 ක දී ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිවලින් රු. 21,121,159 කට ප්‍රතිපාදනවලට අයත් ව්‍යාපෘති 11 ක් විගණන පරීක්ෂාවට ලක් කළ අතර එහිදී නිරීක්ෂණය වූ ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(i) ඇස්තමේන්තු පරිදි මාර්ගවල ඇතිරිය යුතු අන්තර් සම්බන්ධිත කුට්ටිගල්වල ශක්තිය 30 N/mm $^2$ ට වැඩි විය යුතු වුව ද පරීක්ෂාවට භාජනය කරන ලද ඉහත මාර්ග 11 හි අතුරා තිබුණු අන්තර් සම්බන්ධිත කුට්ටිගල්වල ශක්තිය අපේක්ෂිත මට්ටමට වඩා සියයට 17 සිට සියයට 78 දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් අඩු වී තිබුණි.

(ii) එම ඉදකිරීම් අතර එකමුතුගම වික්‍රමබාහු මාවත එකමුතුගම රජායි රාජසිංහ මාවත සහ එකමුතුගම ගොවිපල මාවත යන මාර්ග ඉදිකිරීම් කටයුතු වලදී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මාතර තත්ත්ව පරීක්ෂණාගාරය මඟින් ඉල්ලුම් කළ තත්ත්ව වාර්තා ප්‍රතිඵල නොසලකා හැර තිබුණි. පසුව මාර්ග සංවර්ධන අධිකාරියේ තංගල්ල පරීක්ෂණාගාරයෙන් ලබාගත් තත්ත්ව වාර්තාවක් පදනම් කරගෙන ප්‍රමිතියෙන් තොරව ඉදිකරන ලද ඉහත මාර්ග 3 වෙනුවෙන් රු.5,242,318 ක් ද ඇතුළුව මාර්ග 11 ක ඉදිකිරීම් සඳහා එකතුව රු.16,615,873 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) නැදිගම්විල දෙවට පාර කැටගල් ඇතිරීම සඳහා රු.1,999,942 ක ඇස්තමේන්තුවක් මත ග්‍රාමීය සංවිධානයක් සමඟ 2017 දෙසැම්බර් 13 දින ගිවිසුම් ගතවී තිබුණි. එකී ඉදිකිරීම් 2018 ජනවාරි 16 සහ 23 යන දිනයන්හි දී පරීක්ෂාවට භාජනය කළ අතර ඉදිකිරීම් කටයුතු කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණයකින් තොරව කොන්ත්‍රාත්කරු විසින් සිය අභිමතය පරිදි ඉටුකරමින් පැවතුණි. ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කළ 2018 ජනවාරි 16 දින වන විට මාර්ගයේ කුට්ටිගල් අතුරා අවසන් කර නොතිබුණු අතර 2017 දෙසැම්බර් දින රහිත ලිපියක් මගින් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණයකින් තොරව තත්ත්ව පරීක්ෂණයක් සඳහා නියැදි කුට්ටිගල් තත්ත්ව පරීක්ෂණාගාරය වෙත යොමු කර තිබුණි.

(ඇ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ලුණුගම්වෙහෙර ජලාශයේ ධීවර යාත්‍රා 100 ක් ගාල් කිරීම සඳහා ධීවර ජැටියක් ඉදිකිරීම වෙනුවෙන් 2016 නොවැම්බර් 21 දින රු.706,499 ක් වැය කර තිබුණි. මෙසේ ඉදිකරන ලද ධීවර ජැටිය තුළ ධීවර යාත්‍රා නතර කර තැබීමේ හැකියාවක් නොමැති බවත්, මෙම ජැටිය සකස් කිරීමේ දී ධීවර ප්‍රජාවගේ අදහස් ලබා ගෙන නොමැති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය. එසේම වැඩ විෂයයන් දෙකට අදාළව ලබා ගෙන තිබුණු ව්‍යාජ මිනුම් පදනම් කරගෙන රු. 429,162 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (IV) ඡේදයට අනුකූල නොවී මෙම කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානය විසින් උපකොන්ත්‍රාත් දී ඇති බව ද තහවුරු විය.

(ඈ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ මත්ස්‍ය අලෙවිසැළක් ඉදිකිරීම සඳහා රු.501,623 ක් වැය කර තිබුණි. එහි කොන්ත්‍රාත් කටයුතු 2016 දෙසැම්බර් 29 දින වනවිටත් නිමකර අවසන්ව තිබුණද 2018 මාර්තු 28 දින වන විටත් කිසිඳු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

(ඉ) ලුණුගම්වෙහෙර බස්නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු ඉටුකිරීම සඳහා රු.18,719,672 ක මුදලකට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පවරා දී තිබුණි.

(i) මේ සඳහා 2015 වර්ෂයේ දී නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන මඟින් හා 2017 වර්ෂයේ දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.13,613,542 ක් හා රු.3,820,461 ක් වශයෙන් එකතුව රු.17,434,003 ක් වැය කර තිබුණි.

(ii) කෙසේ වුවද, මීට අමතරව කිසිඳු විධිමත් අනුමැතියක් රහිතව 2017 අගෝස්තු 02 විගණන අවස්ථාව වන විට රුපියල් මිලියන 18.89 ක අතිරේක හා බාහිර වැඩ ඉටු කර තිබුණි. මෙම අතිරේක වැඩ කොටස් සඳහා ඇස්තමේන්තුවක් ද සකස් කර තිබුණු අතර එය මුල් ඇස්තමේන්තුවේ අගයෙන් සියයට 97.53 ක් විය.

(iii) 2017 අගෝස්තු 02 දින වන විටත් ඉදිකිරීම් නිමකර වැඩබිම භාර දී නොතිබූ අතර 2016 ඔක්තෝබර් 22 න් පසුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි. එසේම 2017 අගෝස්තු 7 දින වනවිටත් මුල් ඇස්තමේන්තුවේ වූ රු.1,942,074 ක වැඩ විෂයයන් 30 ක්ද නිමකර නොතිබුණි.

(iv) අවසාන බිල්පත්‍රයට අනුව ඇස්තමේන්තු වැඩ විෂයය අංක O-3 යටතේ ඉටුකර තිබුණු සම්පූර්ණ වැඩ ප්‍රමාණය වර්ග මීටර් 4,428 ක් විය. මේ සඳහා එකඟ වූ රු. 3,600 ක ඒකක මිල තුළ ඇතුළත් එකතු කළ අගය මත බදු මුදල වූ රු. 191.20 ක් හා ඒ මත වූ සියයට 30 ක ලාභය හා පොදුකාර්යය පිරිවැය වූ රු. 57.36 ක් වශයෙන් රු. 248.56 ක් අඩු කළ පසුව මෙම වැඩ කොටස් සඳහා ගෙවිය හැකි මුදල රු. 14,840,176 ක් වුවත් මෙම වැඩ විෂයය සඳහා රු. 19,694,608 ක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. ඒ අනුව මෙම වැඩ විෂයය සඳහා රු. 4,854,432 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- මිලිමීටර් 200 ක ABC මිශ්‍ර ගල් තට්ටුවක් යෙදීම ද ඇස්තමේන්තු වැඩ විෂයය අංක O-3 ට ඇතුළත් වී තිබිය දී, ABC මිශ්‍ර ගල් ඝන මීටර් 521.44 ක් සඳහා රු. 1,745,481 ක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. ලබා ගෙන තිබුණු රසායනාගාර වාර්තා අනුව අතුරා ඇති ABC මිශ්‍ර ගල් තට්ටුවේ සාමාන්‍ය ඝනකම මිලිමීටර් 102 ක් පමණ වූයෙන් වැඩ විෂයය අංක O-3 යටතේ ගෙවීමට නිර්දේශිත මුදලින් තවදුරටත් රු. 1,555,335 ක් අඩු කළ යුතුව තිබුණ බව නිරීක්ෂණය විය.

- බස් නැවතුම්පළෙහි බිම ස්ථාන කිහිපයක පිපිරීම් නිරීක්‍ෂණය වූ අතර වැල්ලවාය දෙසින් බස් නැවතුමට ප්‍රවේශ වීම සඳහා යොදා ඇති පෙට්ටි බෝක්කුවේ තට්ටුව ද පුපුරා ඇති බව නිරීක්ෂණය විය. එසේම බස් නැවතුම්පළෙහි වහල වැඩි උසකින් ඉදි කර ඇති බැවින් වැසි අවස්ථාවල දී බස්නැවතුම්පළ ඇතුළත අධික ලෙස තෙමෙන තත්ත්වයක් ද පැවතුණි.

(ඊ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් අගුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගුරුන්නැහෙගේ ආර ග්‍රාම නිලධාරී වසමේ ඩී-5 ඇල පැති බැම්ම මීටර් 10 ක් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ගොවි සංවිධානයක් වෙත 2015 දෙසැම්බර් 31 වන දින රු.980,340 ක් ගෙවා තිබුණි. ඉදිකිරීමේ සැලසුම් දුර්වලතා හේතුවෙන් 2016 මැයි 10 වන දින මෙම පැති බැම්ම ඇල මාර්ගය තුලට කඩා වැටී තිබුණි. විගණිත දිනය වූ 2017 ජුනි 01 දින වන විටත් පැති බැම්මේ කඩා වැටුණු කොටස් ඇල මාර්ගය තුළ දක්නට ලැබුණු අතර ඉදිකිරීම සඳහා ගෙවීම් කළ ඉහත සම්පූර්ණ මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි.

(උ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන සම්බන්ධයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව සිදු කරන ලද විගණනයේ දී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) යතුරුපැදි ලබා දුන් ක්ෂේත්‍ර නිළධාරීන්ගේ මූලික තොරතුරු පවා ලේඛනවල ඇතුළත් නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ii) 2017 අප්‍රේල් 30 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ, නිකුත් කරන ලද යතුරුපැදි හා ස්කූටර් සංඛ්‍යාව හා විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දැක්වෙන යතුරුපැදි හා ස්කූටර් සංඛ්‍යාව අතර පිළිවෙලින් 348 ක හා ස්කූටර් 347 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) 2014 ජුනි 30 දිනට ඉදිරි සේවා කාලය වසරකට අඩු නිළධාරීන්ගේ යතුරුපැදියක් සඳහා රු. 100,000 ක් අය කළ යුතු වුවත් තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉදිරි සේවා කාලය වසරකට අඩු නිළධාරියෙකුගෙන් රු.50,000 ක් පමණක් අය කර යතුරුපැදිය ලබා දී තිබුණි.

(iv) යතුරුපැදි ලබා දුන් එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ලබා දුන් යතුරුපැදිය පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් ලිපිගොනුවක් වර්ෂ 5 ක් ගතවන තුරු පවත්වාගෙන යා යුතු වුවත් කිසිඳු කාර්යාලයක් විසින් එවැනි ලිපි ගොනු පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(v) යතුරුපැදි ලබා ගත් නිළධාරියෙකු වසර 5 ක් ගතවීමට ප්‍රථම වැටුප් රහිත නිවාඩු මත හෝ මාස 6 කට වැඩි වැටුප් සහිත නිවාඩු ලබා ගෙන හෝ විදේශගත වන්නේ නම් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම අය කළ යුතු වුවත් එසේ විදේශගත වූ නිළධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු රු. 869,520 ක මුදලක් අය කර ගෙන නොතිබුණි.

(vi) යතුරුපැදි ලබා ගත් නිළධාරියෙකු වසර 5 ක් ගතවීමට පෙර යතුරුපැදි හිමි නොවන තනතුරකට යාමේ දී සහ ඉල්ලා අස්වීමේ දී යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම අය කළ යුතු වුවත්, යතුරුපැදි හිමි නොවන තනතුරුවලට පත්වීම් ලැබූ නිළධාරීන් 08 දෙනෙකුගන් අය විය යුතු රු. 1,046,520 ක මුදලක් අය කර ගෙන නොතිබුණි.

(vii) මෙම වැඩසටහන යටතේ ලබා දුන් සියලු යතුරුපැදි සඳහා වර්ෂ 5 ක් ගතවන තුරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් හෝ ජාතික රක්ෂණ භාර අරමුදල මගින් හෝ පූර්ණ

රක්‍ෂණාවරණයක් ලබා ගත යුතු වුවත් නිළධාරීන් බහුතරයක් ඊට අනුකූලව කටයුතු නොකර තුන්වන පාර්ශව රක්‍ෂණාවරණයක් ලබා ගෙන තිබුණි. මේ පිළිබඳව පසුවිපරම් ක්‍රියාමාර්ග කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් සිදුකර නොතිබුණි.

**2.10.3 අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති**

විධිමත් පරිදි අනුමත නොකළ හා ඉටුකිරීමට යෝජිත වැඩ විෂයයට අදාළ නොවන මිල ගණන් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශ 03 ක් විසින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක මාර්ග සංවර්ධන ව්‍යාපෘති 264 ක් සඳහා රු. 43,770,611 ක් ද මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් ආයතනය නිශ්චිතව දක්වා නොතිබුණු, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළව රු. 6,423,048 ක් ද ලෙස රු. 50,193,659 ක් වැඩිපුර ගෙවා තිබුණි. මීට අමතරව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 17 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් සහ තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 73.00 | 70.39 | 41.00 | 41.58 | 212.00 | 781.50 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,825,038 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 22 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා 2016 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එවා තිබුණු රු. 1,998,390 ක මුදලක් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.13 අනුකූල නොවීම්

### 2.13.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශය ප්‍රකාරව, 2016 වර්ෂයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 10 ක් වෙනුවෙන් ලබාගත යුතු බදු ඉන්වොයිස්පත් ලබාගැනීමකින් තොරව, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරු වෙත රු.1,328,207 ක වැට් බදු ගෙවා තිබුණි.

## 2.14 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක අභ්‍යන්තර විගණනය සිදු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආදායම් විගණනය කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 2.15 මානව සම්පත් කළමනාකරණය

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 573.68 ක් වියදම් කර තිබු අතර ඒක පුද්ගල වියදම රු. 479,262 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 47 | 43 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 32 | 18 | 15 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 1120 | 1033 | 126 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 115 | 103 | 13 | 01 |
| | එකතුව | 1314 | 1197 | 158 | 41 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 158 ක් ද අතිරික්ත සේවක සංඛ්‍යාව 41 ක් ද විය. නියමිත ශ්‍රේණිවලට අදාල නිලධාරීන් බඳවා නොගැනීම නිසා ඉහත අතිරික්තය සිදුවී තිබූ අතර, ඒ අනුව සත්‍ය වශයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 117 ක් විය. එම පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කළ යුතුව තිබූ බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත නිලධාරීන් ස්ථිර නිලධාරීන් වන බවත් අතිරික්ත වුවද

වෙනත් පුරප්පාඩු තනතුරුවල රාජකාරී ආවරණය කරගැනීමට යොදවා ඇති බවද 2018 ජුලි 04 දින විගණනය වෙත දන්වා ඇත.

## 2.16 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

----------------------------------

රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ඇප තැබිය යුතු නිලධාරී 73 ක් විසින් රු. 168,400 ක් වූ ඇප මුදල් තබා නොතිබුණි.